**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023**
**නර්තනය I**

නම/විභාග අංකය :........................................................................................ කාලය පැය 03 යි

- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. ශාන්තිකර්මවල දැකිය හැකි අනාසාතාත්මක ගායනයක් ලෙස ..................................... හැඳින්විය හැකිය.
   (I) මල්යහන් කවි (II) නමස්කාර කවි (III) කඩතුරා කවි (IV) කෝල්මුර කවි

2. දොංතකු දොංතකු දොං ජිං ගත් තත් ජිං තරිකිට මෙය මාත්‍රා ....................... තාල රූපයට අයත් බෙර පදයකි.
   (I) 2+3 (II) 2+2+4 (III) 2+2+3 (IV) 3+4

3. ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය ජාතිකයෙකු වූ රොබට් නොක්ස් විසින් ............................. නම් ග්‍රන්ථය රචනා කරන ලදී.
   (I ) විදේශීන් දුටු පුරාණ ලංකාව (II) එදා හෙළදිව
   (III ) හෙළ ගී මග (IV) සිංහල ගැමි නාටකය

4. පහතරට නර්තන සම්ප්‍රදායේ ඉලංගම් සරඹවලට සමානව සබරගමු සම්ප්‍රදායේ .................. භාවිත කරයි
   (I) ගොඩ සරඹ (II) මණ්ඩිපද (III) පාසරඹ (IV) දොඹින පද

5. පරාක්‍රමබාහු රජු විසින් නාට්‍යශාලා 05ක් ඉදිකල බව ............................. සඳහන් වේ
   (I) බෝධිවංශයේ (II) චූලවංශයේ (III) මහාවංශයේ (IV) දීපවංශයේ

6. සොකරි සහ ආඩිගුරුගේ අතවැසියා ලෙස ............................ හැඳින්වේ.
   (I) පරයා (II) වෙදරාළ (III) කාලි (IV) සොත්තානා

7. ප්‍රසිද්ධ වේදිකා නළුවකු වූ සීබට් ඩයස් මහතා විසින් .......................... නාටකය 1936 දී නිෂ්පාදනය කර ඇත.
   (I) ශාප්මෝචන් (II) සිරිසඟබෝ (III) මනෝහරබන්ධනම් (IV) කරදිය

8. පද්‍ය,ගීත,වාද,සංවාද ආදියෙන් කෙරෙන අදහස් ප්‍රකාශනය ................ අභිනය ලෙස හැඳින්වේ.
   (I) ආංගික (II) ආහාර්ය (III) වාචික (IV) සාත්වික

9. පුරවර මැද බැඳි රන්ඔන්චිල්ලා .................... මෙහි දෙවෙනි කවි පේලිය .......................... ය
   (I) වැරසර පිරිමිනි තව පැදපල්ලා (II) සුරපුර දෙවියනි රැකුමෙසියල්ලා
   (III) දුරයන තරමට පුදුම නොවෙල්ලා (IV) අපිත් පදිමු දැන් රන් ඔන්චිල්ලා

10. ඓතිහාසික තොරතුරුවලට අනුව දළදා පෙරහැර මුල්වරට පවත්වන ලද්දේ හතරවන සියවසේ .................... රජුගේ කාලයේය
   (I) විමලධර්මසූරිය (II) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ (III) මහා පරාක්‍රමබාහු (IV) කිත්සිරිමෙවන්

11.   

ඉහත ඡායාරූපවලින් පිළිඹිබු වන රසයන් වන්නේ

(I) භීභත්ස්‍ය ,කරුණා,රෞද්‍ර (II) භයානක,කරුණා, භීභත්ස්‍ය
(III) වීර,කරුණා,රෞද්‍ර (IV) වීර,හාස්‍ය, භීභත්ස්‍ය

12. මුද්‍රා නාට්‍ය ශිල්පියෙකු වූ වසන්ත කුමාර මහතා විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍ය 02ක් වන්නේ

(I) හිරෝෂිමා,කුඹුරු පනත (II) සුදෝසුදු ,පැරකුම්විලා
(III) කරදිය,නළ දමයන්ති (IV) ග්‍රහඅපලය,සත්පත්තිනි

13. සුරඹාවල්ලිය,රතිරාගවන්නම,වැනි පහතරට නර්තනයන් ප්‍රසංග වේදිකාවට සුදුසු ලෙස නිර්මාණය කරන ලද්දේ

(I) ජයසේන කෝට්ටේගොඩ මහතා විසිනි (II) කේ.එස්. ප්‍රනාන්දු මහතා විසිනි
(III) හීන්නිලමෙ මහතා විසිනි (IV) ලයනල් බෙන්තරගේ මහතා විසිනි

14. කතකලී නර්තන සම්ප්‍රදායේ අත්වැල් ගායනය හඳුන්වන්නේ

(I) පොන්නානි ලෙස ය (II) සිංකිඩි ලෙස ය
(III) පත්තුකාරන් ලෙස ය (IV) නටුවනාර් ලෙස ය

15. 

මෙම ඡායාරූපයෙන් දැක්වෙන වාද්‍ය භාණ්ඩය භාවිත කරන ඉන්දීය නර්තන සම්ප්‍රදාය කුමක්ද?

(I) භරත (II) කතකලි (II) මණිපූරි (IV) කතක්

16. ගුද ගතිගත ගුදගුද ගතිගත , මෙම බෙරපදයට පහතරට කෝලම් නාටකය තුළ සභාවට පිවිසෙන චරිතය වන්නේ

(I) නාගකන්‍යා ය (II) ජසයා ය (III) අණබෙරකරු ය (IV) මුදලි ය

17. භරත නාට්‍යම් උගන්වන ප්‍රධාන ආයතනයක් වන්නේ

(I) විශ්ව භාරතී විශ්වවිද්‍යාලය (II) කේරළ කලා මණ්ඩලම්
(III) ශාන්ති නිකේතනය (IV) අඩයාර්හි කලා ක්ෂේත්‍රය

18. මණිපූරි නර්තනයේ විවිධ තාල මත කෙරෙන සාමූහික නර්තනය හඳුන්වන්නේ

(I) රාස්ලීලා ලෙස ය (II) පුංග්චෝලම් ලෙස ය
(III) කර්තාල් චෝලම් ලෙස ය (IV) පරේංග් ලෙස ය

- 19-21 තෙක් නිවැරදි පිළිතුරු පහත වගුව ඇසුරෙන් තෝරන්න

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1 | තම්මැට්ටම | දවුල | දඬුබෙරය |
| 2 | උඩැක්කිය | ගැටබෙරය | රබාන |
| 3 | පන්තේරුව | බුම්මැඩිය | දෙවොල්බෙරය |

19. විතත භාණ්ඩ දක්නට ලැබෙන්නේ
(I) 1 පේළියේ A හා C තීරුවේය (II) 2 පේළියේ B හා C තීරුවේය
(III) B පේළියේ A තීරුවේය (IV) C පේළියේ B තීරුවේය'

20. හයි තට්ටුව හා සුරල් තට්ටුව ලෙස බෙර ඇස හඳුන්වන වාද්‍ය භාණ්ඩ දක්නට ඇත්තේ
(I) 1 පේළියේ B තීරුවේය (II) 2 පේළියේ A තීරුවේය
(III) 2 පේළියේ B තීරුවේය (IV) 3 පේළියේ C තීරුවේය

21. බෙරයෙහි මුහුණතෙහි විෂ්කම්භය විග්ගුස්සක් ලෙස දැක්වෙන වාද්‍ය භාණ්ඩ දක්නට ලැබෙන්නේ
(I) 1 පේළියේ B තීරුවේය (II) 3 පේළියේ C තීරුවේය
(III) 2 පේළියේ B තීරුවේය (IV) 1 පේළියේ A තීරුවේය

22. උඩරට ,පහතරට හා සබරගමු සම්ප්‍රදායන්ට අයත් රංග වස්ත්‍රාභරණ පිළිවෙලින්
(I) රහුකුට්ටම ,පබළුරැල්ල , හහල ලණුව (II) පච්චවඩම ,අත්පොටහතර,දෙවල්ල
(III) රතුරෙද්ද,පබළු හැට්ටය,නෙත්තිමාලය (IV) කෙමෙත්ත,පබළු ඉනහැඩය,හැඩකැල්ල

23. කොහොඹාකංකාරිය,දෙවොල්මඩුව,පහන්මඩුව යන ශාන්තිකර්ම තුනෙහි දක්නට ලැබෙන චාරිත්‍ර විධි වන්නේ
(I) ගිනිපෑගීම,කප්සිටුවීම,නානුමුර මංගල්‍යය (II) කප්සිටුවීම,මිල්ලකැපීම ,මලපේකිරීම
(III) මුරුතැන්පිසීම ,බිසෝකප සිටුවීම,දේවාරාධනාව (IV)හළඹ වැඩමවීම ,තොටමෙටයාම,කිරි ඉතිරවීම

24. ''ශාන්ති කර්ම හා සිංහල සමාජය'' කෘතිය රචනා කරන ලද්දේ
(I) මහාචාර්ය තිස්ස කාරියවසම් විසිනි (II) මහාචාර්ය මුදියන්සේ දිසානායක විසිනි
(III) මහාචාර්ය ලයනල් බෙන්තරගේ විසිනි (IV) මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ විසිනි

25. ඇත් පහනේ නළඟනකගේ ලෝහමය රූපයක් දක්නට ඇත්තේ
(I) පොළොන්නරුවේ අංක 2 දරණ ශිවදේවාලයේය
(II) දැදිගම කොටවෙහෙර සුතිඝර චෛත්‍යයෙහිය
(III) පොල්වත්ත පන්සලේය
(IV) ඇම්බැක්කේ කතරගම දේවාලයේය

26. සුලකු, පින්නල් කෝලාට්ටම්, අරිච්චෙට්ටු, ද්‍රවිඩ ගැමි නැටුම්වලට සමාන සිංහල ගැමි නැටුම් වනුයේ,
(I) කුළු, ලීකෙලි හා ගොයම් නැටුම ය (II) ගොයම් නැටුම, කුළු හා කළගෙඩි ය
(III) කළගෙඩි, ලීමල්ලිය හා කුළු ය (IV) කුළු, ලීමල්ලිය හා ගොයම් නැටුම ය

27. රස සිද්ධාන්ත පිළිබඳ විග්‍රහ කර ඇති පෙරදිග කතුවරුන් ඇතුළත් වරණය වන්නේ
(I) භරතමුණි හා නන්දිකේශ්වරය (II) භරතමුණි හා ප්ලේටෝය
(III) අභිනවගුප්ත හා නන්දිකේශ්වරය (IV) නන්දිකේශ්වර හා ඇරිස්ටෝටල්ය

28. රනේ රුවසෙ වත රුවින් දිලේදෝ... මෙම කවිය අයත් ගැමි නැටුම් විශේෂය වනුයේ
(I) කළගෙඩි ය (II) ලීකෙලි ය (II) ගොයම් ය (IV) මෝල්ගස් ය

29. අ.පො.ස උසස් පෙළ සඳහා නර්තනය විෂයක් වශයෙන් ඇතුළත් වූයේ
(I) 1972 දී ය (II) 1978 දී ය (III) 1974 දී ය (IV) 1948 දී ය

30. බෙරහඩ නාට්‍යය නිර්මාණය කරන ලද්දේ,
(I) බන්දුල ජයවර්ධන විසිනි (II) නීතීඥ ජෝන් ද සිල්වා විසිනි
(III) වජිරා චිත්‍රසේන විසිනි (IV) සුදත් සමරසිංහ විසිනි

31. 9 වන ගොඩ සරඹයේ සරඹ නාමය වන්නේ
(I) පැනීම් සරඹය (II) දෑත පැගීමේ සරඹය (III) බඹර සරඹය (IV) අර්ධ චක්‍ර සරඹය

32. සැවුලා වන්නමට අයත් බෙරපදය වන්නේ
(I) දොංජිංත ගතදොංත (II) දෝං ජිංජිං තකට දොංතක
(III) දොං දොං ජිං ජිං ගජිගත (IV) දොදොංත තකුදොං

33. ගත්ත තෙහිතු තකට තකුද ............ මෙම අඩව්ව නර්තනය කරනු දක්නට ලැබෙන්නේ
(I) වෛරෝඩි වන්නමේ ය (II) මුසලඩි වන්නමේ ය
(III) තුරඟා වන්නමේ ය (IV) සැවුලා වන්නමේ ය

34. කුදාංත ගතදොං වට්ටම නර්තනය කරන තාලරූපය වන්නේ
(I) මාත්‍රා 2+3 ය (II) මාත්‍රා 2+2+3 ය (III) මාත්‍රා 2+4 ය (IV) මාත්‍රා 2+2+4 ය

35. සුළු මැදුම් දෙතිතට අයත් අඩව්වකි
(I) තත්ත තරි තරි ........... (II) තාම් දොමිතිගත ................
(III) ගත්ත තෙහිගු තකට තකුද........ (IV) තත් තකට තක රොං ..................

36. කොහොඹාකංකාරිය පුරාවෘත්ත කථාවේ එන චරිත දෙකකි.
(I) මහා සම්මත රජු හා මැණික්පාල බිසව (II) මලය රජු හා රාහු අසුරේන්ද්‍රයා
(III) කුවේණි හා සේරමාන් රජු (IV) සේරමාන් රජු හා රාහු අසුරේන්ද්‍රයා

37. ගැටබෙරයේ දකුණු ඇස ආරක්ෂාව සඳහා දමනු ලබන්නේ
(I) කැපුම් හමය (II) සුරත් තට්ටුවය (III) කන්වරය ය (IV) වෙනිවර ය

38. කොහොඹාකංකාරියේ පුදලබන ප්‍රධාන දෙවිවරු වන්නේ
(I) කොහොඹා දෙවි හා දෙවොල් දෙවි ය (II) පත්තිනි දේවිය හා වීරමුණ්ඩ දෙවි ය
(III) වීරමුණ්ඩ දෙවි හා දෙවොල් දෙවි ය (IV) කොහොඹා දෙවි හා බණ්ඩාර දෙවි ය

39. දොංතකු දොං ජිංතත් ජිංතත් ජිං තරිකිට .................. මෙම අලංකාර බෙරපදය වාදනය කළ හැකි තාලරූපය වන්නේ
(I) මාත්‍රා 2+3 ය (II) මාත්‍රා 2+4 ය (III) මාත්‍රා 3+3 ය (IV) මාත්‍රා 4+4 ය

40. උඩරට දහඅට වන්නම් රචනා කරන ලද බව කියැවෙන්නේ,
(I) ගණිතාලංකාර හා රම්මොලවක අධිකාරම විසිනි (II) ගණිතාලංකාර හා හරණ ගණිතයා විසිනි
(III) රම්මොලවක අධිකාරම හා අලගනායිදු විසිනි (IV) හරණ ගණිතයා හා රම්මොලවක අධිකාරම විසිනි

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023**
**නර්තනය II**

නම/විභාග අංකය :.........................................................................................

01. සියලු ම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

(i) සරඹ අභ්‍යාස කිරීමේදී සිව් ගුණ වශයෙන් හඳුන්වනුයේ ................................................. ලයයි.

(ii) ජනවාරි 26 මුද්‍රා නාට්‍ය දිනය ලෙස නම්කර ඇත්තේ ..................................... මහතාට උපහාරයක් ලෙස ය.

(iii) බ්‍රහ්මපති අසුරයා හා ඊශ්වරයා පිළිබඳ කථා ප්‍රවෘත්තිය අන්තර්ගත අවස්ථාව දක්නට ලැබෙන්නේ ................................................ යක්කමේ ය.

(iv) විජයතුමා තම්මැන්නේ ....... ගීතය රචනා කරන ලද්දේ ..........................................විසිනි.

(v) 1980 වර්ෂයේ දී මෝල්ගස් නැටුම ප්‍රාසාංගික වේදිකාවට සුදුසු පරිදි නිර්මාණය කිරීම සඳහා ........................................... දායක විය.

(vi) පැවිය ගන දුරු දුරුර දිවාකර... මෙම කවිය .................................................. තුන් තිතට ගායනය කල හැකි ය.

(vii) උඩරට නර්තන සම්ප්‍රදායේ යක්තුන් පදය ගායනා ..................................................නර්තන අංගයකි.

(viii) නළලෙහි සලකුණු තබා දේවදාසීන් හත් දෙනෙකු පිදූ බවත්, ඔවුන්ට තැන්පත් කළ මුදලින් කාසි ගෙවූ බවත් ............................................. සෙල්ලිපියෙහි සඳහන් වේ.

(ix) පහත සඳහන් භාණ්ඩ දෙක වාදනය කරනු ලබන නර්තන සම්ප්‍රදායයන් දෙක නම් කරන්න.

1. නටුවාංගම් -.........................................................
2. චෙංගිලම් -.........................................................

(x) කුඹිකථාව මුද්‍රා නාට්‍යයේ සංගීතය හා රංග වස්ත්‍ර නිර්මාණයට දායක වූවන් නම් කරන්න.

1. සංගීතය -.........................................................
2. රංග වස්ත්‍ර නිර්මාණය -.........................................................

02. i. සුළු මැදුම් දෙතිතට බෙර පදයක් ප්‍රස්තාර කරන්න.
ii. සොබමන් දෙව්වරු සදෙනෙක් එතනට
බසිමින් චාමර ගත්තේ සුරතට ..... මෙම කවි පද මාත්‍රා 4+4 තාල රූපයට ප්‍රස්තාර කරන්න.
iii. සැවුලා වන්නමට අයත් අඩව්වක් ප්‍රස්තාර කරන්න.

03. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් තෝරා ගෙන කෙටියෙන් විස්තර කරන්න.

- පංචතූර්ය වාද්‍ය භාණ්ඩ
- නව නළු රස
- මිරැන්ඩා හේමලතා මහත්මිය
- ග්‍රහපන්ති කවි
- වෘත්තීය ගැමි නැටුම්

04. ශාන්ති කර්මවල එන කථා පුවත්, නර්තන, ගායන හා නාට්‍යමය පෙළපාලි තුලින් දේශීය නර්තන කලාවේ අනන්‍ය ලක්ෂණ පිළිඹිඹු කරයි.

i. කොහොඹා කංකාරියේ ගායනා සහිත නර්තන  අංග දෙකක් හඳුන්වන්න.

ii. දෙවොල්මඩු ශාන්ති කර්මයේ නාට්‍යමය පෙළපාලි දෙකක් විස්තර කරන්න.

iii. සබරගමු පහන්මඩුව ශාන්ති කර්මයේ පුරා වෘත්තය තුළින් සමාජයට ලබාදෙන උපදේශය පිළිබඳ විමසීමක් කරන්න.

05. පහත රූප රාමු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

i. “A” රූපයේ දැක්වෙන නාටකයට අදාළ කවියක් ලියන්න.

ii. “B” රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර එහි භාවිත රංග වස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කරන්න.

iii. “C” රූපයේ දැක්වෙන දේශීය මුද්‍රා නාට්‍ය නම් කර ඒ පිළිබඳ ඇගයීමක් කරන්න.

06. I. අනුරාධපුර යුගයේ නර්තන කලා ඉතිහාසය හා සම්බන්ධ මූලාශ්‍ර දෙකක් දක්වන්න.

Ii. කෝට්ටේ යුගයේ සංදේශ කාව්‍යයක් ඇසුරින් නළඟන වැනුම් පිළිබඳ කියැවෙන සාධකයක් ඉදිරිපත් කරන්න.

iii. 1980 න් පසු නර්තන කලාවේ  අධ්‍යාපනික  සංවර්ධනයට බලපෑ කරුණු දෙකක් විස්තර කරන්න.

07. i. සමාජ සහජීවනය හා නායකත්ව ගුණාංග වර්ධනයට නර්තන කලාව කොතෙක් දුරට ඉවහල් වේ දැයි උදාහරණ සහිතව දක්වන්න.

Ii. නර්තන නිර්මාණ සඳහා චිත්‍ර කලාවෙන් ලැබෙන පිටිවහල පිළිබඳ විමසුමක් කරන්න.

Iii. නාට්‍ය කලාවේ භාවාත්මක ප්‍රකාශනය සඳහා නර්තනය යොදා ගෙන ඇති ආකාරය විමසුමට ලක් කරන්න.